# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 11
NUMBER 11

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

FEBRUARY 10, 2009 පෙබරවාරි මාසය (බුද්ධ වර්ෂ 2552 නවම් මාසය)




The Defenders of Our Land & Nation



Victorious Sri Lanka Armed Forces

විජයග්‍රාහී ශ්‍රීලංකා සන්නද්ධ හමුදා

සිටිනා ගොඩබිම ද සයුර ද ගුවන් කුස
නිතිනා හඹා ගොස් වනසා රුපුන් විස
වටිනා ජන්ම බිම සුරකින පුතුන් දෙස
තුටිනා බලයි! ලක් මව පිසලමින් ඇස

**From the land, from the ocean and from air**
**Tracking the vicious foe, annihilating them there**
**Seeing her sons protect the land that is so dear**
**Happy, content Mother Lanka wipes a tiny tear**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

# මෙන්න! නියම නොනවතින රැල්ල

## Here's the Real Unceasing Wave!

♦ **සංජය විමලරත්න**

With the collapse of Elephant Pass in 2000 into their hands, the Tamil Tigers referred their war with government forces as the **Unceasing Wave** towards the Eelam. While this wave never materialised, they are now experiencing the real unceasing wave of attacks by our valiant forces advancing steadily for the last few months and with increasing rapidity the last few days. The so called 'Eelaam Army' has been running away with their tails between the legs abandoning their camps and bunkers. They lost their last Sea Tiger base on the 6th Feb. and are really trapped with access to the sea cut off. At the present moment of writing they are confined to a little more than hundred square kilometers.

Last November in his **Thalaivars Speech** Prabakaran reiterated the victory of Eelaam and taunted President Rajapakse for the govt's idea of stopping them as only a pipe dream.

**By the time this paper comes out of print their Eelaam now will have diminished to a pipe dream of Prabakaran !**
**And, that's the reality.**

වසර 2000 දී කොටි අලිමංකඩ හමුදා කඳවුරට දුන් ප්‍රහාරයේදී එය හමුදාව අතින් ගිලිහී අලිමංකඩ කොටින්ගේ ග්‍රහණයට හසුවිය. ඉන් දිරිමත්වූ කොටි තම අරමුණ වූ ඊළම් රාජයය කරා යන ගමනේ දී හමුදාවට එරෙහිව කරන යුද්ධයට එදා නමක් තබා එය හැඳින්වූයේ අන් සීසින් වේව් හෙවත් **නොනවතින රැල්ල** යනුවෙනි. නමුත් මෙකී නොනවතින රැල්ල සහ ඊළමට යන ගමන පැත්තක තබා කොටි දැන් රජයේ සන්නද්ධ හමුදාවන්ගෙන් නොවතින පහරකමින් වල්ගය දෙකකුල් අතර රුවාගෙන තමන්ගේ බංකර්ද, කැමබීමද අතහැර හිස හැරුණු අත මරබියේ දුවන හැටි හොඳින් පෙනේ. කොටින්ට ඔවුන්ගේ අවසාන මුහුදු බලකොටුවද පෙබරවාරි **6** වෙනිදා අහිමිවිය. දැන් ඔවුන් හතරැස් කිලෝ මීටර් සීයකටත් වඩා කුඩා ප්‍රදේශයකට කොටුවී සිටිති.

වැඩිකල් නොවේ, දැන් මාස තුනකට පෙර නොවැම්බරයේ දී ප්‍රභාකරන් සිය මහාවීර දිනයේ කරන සුප්‍රකට පම්පෝරි කතාවේදී කියා සිටියේ නිසැකවම ඊළම පිහිටුවන බවත්, එය නවත්වන්නට ශ්‍රීලංකා රජය සිතන්නේ නම් එය ජනාධිපති රාජපක්ෂගේ කිසිදා සැබෑනොවන සිහිනයක් පමණක් බවත්ය. එහෙත් මේ ලියන මොහොතේ උතුරේ සටන් බිමේ නිරත අප වීරෝදාර හමුදා ක්‍රියාකාරකම් හමුවේ ප්‍රභාකරන්ට දැන් හීනයක්වත් ඉතුරු වී නැත.

ලොවපුරා නිරීක්ෂකයන් හා විවිධ ප්‍රවෘත්ති ජාල දැන් නිරන්තරයෙන් වාර්තා ගෙනෙන්නේ ශ්‍රීලංකාවේ කොටි සංවිධානයේ පරාජය සහ පූර්ණ බිඳවැටීම දැන් කිසිසේත් නැවැත්විය නොහැකි බවය. සුප්‍රකට ද්‍රවිඩ මාධ්‍යකරුවෙකු වන ඩී. බී. එස්. ජෙයරාජ් ගිය සතියේ ලියා තිබුණේ කොටි සංවිධානයට පුහුණු කාඩරයන් 15, 000 ක් ඇතැයි ද ඔවුන් අවසාන සටනට පෙළ ගැසෙන බවටද තමා කළ ප්‍රකාශය වැරදි බවය. රොයිටර් සඳහන් කරන්නේ දැන් කාඩරයන් 2000 කටත් වඩා අඩුවී ඇති බවය.

මේ අනුව ටැමිල් නෙට් වැනි කොටි හිතවාදී වෙබ් අඩවි වර්ණනා කරන ප්‍රභාකරන්ගේ කිසිදා පරාජය කළ නොහැකි ඊළම් හට හමුදාවේ ප්‍රමාණය හා ශක්තිය සම්පූර්ණ යෙන් ගොතා ඇති බොරුවක් බව දැන් මනාව ඔප්පු වේ. වේ. විශාල පිපිරුම් හඬකින් ඩෝංගා බිහිසුණු ශබ්දයක් නංවනු ඇතැයි බොහෝ දෙනා සිතූ කොටින්ගේ අවසාන සටන නිකම් ම ශබ්දයක් නැති පුස් වෙඩිල්ලක් බවට පත්විය. මෙය අපට ඉරාකයේ සදාම් හුසේන්ගේ බිඳවැටීමට සිහිගන්වයි.

මෙතෙක් කොටින්ට මැරීගෙන සහාය දැක්වූ බීබීසී සහ ගාඩියන් වැනි මාධ්‍ය ආයතනයන්ට දැන් එල්ටීටීඊය පරාජය කරා යමින් සිටින බව අකමැතතෙන් වුවද ප්‍රකාශ කරන්නට සිදුව ඇත. මේ සතියේ ලංකාවේ පාර්ලිමේන්තුව තුළ දී යූඇන්පි යද එසේ කළේය. මීට කලින් ඔව්හු අප සන්නද්ධ හමුදාවන් සමච්චලයට ලක් කළ පිරිස වෙති. එහෙත් දැන් ඔව්හු හමුදාවන්ට මුව පුරා ස්තුති කරති.

**4 වන පිටුව බලන්න →**

**ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website**
**http://www. lankaheritage.com/lankaviththi/**


